32 වන පිටෙන්

ඒකෙ ප්‍රධාන චරිතෙ කළේ විජේ නේ.''
''හ්ම්. අහල තියනවා. ඒ කාලේ බලන්න යන්න දුන්නේ නෑනේ. ඒ නිළිය කවුද. මාධවී ..එයා දැන් නෑ නේද?

බොහෝවිට මොවුන්ගේ මේ කතාබහ යළිත් මගේ සිත කොනිත්තන්නට විය. මේ කතා කෙළවර වූයේ කොහිදැයි මා නොදත්තේ මා ඊට සම්බන්ද නොවී පිටව ගිය බැවිණි. එවන් දිනක මා නිවසට පැමිණියේ කෝපයෙන් දැයි මට සිතේ. සියල්ල පයින් ගසා වහා ආපසු දිවයන්නට සිතුනත් දැන් ඊට බොහෝ සෙයින් ප්‍රමාද වී තිබිණ.

දෙමව්පියන් විසින් ගෙනා යෝජිත විවාහ යකින් නිමල්කා සමඟ මම අතිනත ගෙන සිටියෙමි. නිමල්කා දැන් සිව්මස් ගැබිනියකි. අප දෙදෙනා විසින් නිර්මාණය කරගත්ත කුටුම්භය රැකගත යුතුය යන හැඟීමෙන් සෙසු බොහෝ දේ ඉවතට විසිවී තිබුණි. එක්තරා දිනෙක මා වෙත සතුට දැන්වූ පුවතක් සැලවිය. ඒ පියුමිකා නම් අපගේ කුඩා දියණියගේ උපතයි. එය අසීම මා තුළ මහත් වූ අමන්දානන්දය ඇතිකළ කරුණක් විය. එකළ නිවසේ වැඩි කාලයක් ගෙවමින් ඈ දෝතේ තබාගෙන සිටීම මා ඉතාමත් ප්‍රිය කළ කාරියක් විය. ඇය සිනාසෙන අයුරු දැක අප දෙදෙනාද සිනාසුනි. ඇය හඬන විට අපි දෙදෙනාද හඬන්නට වීමු. මමත් නිමල්කාත් අතර ඇති වූ හැලහැප්පීම්, අඬදබර බොහොමයක් අවසන් වූයේ පියුමිගේ වත මඬලෙනි. අප දෙදෙනා දබර වනු දැක පියුමිකා සිනාසුනාය.

දිනක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය යෙදෙන අවදියේ මා වෙන දිව ආ පියුමි.

''තාත්තා. ඔයා දන්නවද අද අපේ මීඩියා පාඩමේ සිනමා ඉතිහාසය ගැන කියද්දී කීවා ''මරිගුව'' කියන ෆිල්ම් එක ගැන''

''ඉතින් මොනවද ලෙක්චර් කීවේ.''

''එයා කීව ඒක 70 දශකයේ සාමාජවාදී චින්තනයකින් නව නිර්මාණය කරපු චිත්‍රපට රැල්ලේ හොඳම චිත්‍රපටියක් කියල.. වසන්ත අන්කල්ගේ චිත්‍රපටි වලින් හොඳම චිත්‍රපටිය ක් කියලන් කීව.''

''ඒ විතරක් නෙවෙයි ඒ කාලේ හැටියට ඒක ආන්දෝලනාත්මක චිත්‍රපටියක් උනා.'' මම කියවමින් සිටි පුවත්පත පසෙකින් තබමින් කීවෙමි.

''හ්ම්. දවසක් තමරා නැන්දන් කීවා, සීයා තාත්තට කෑගහවයි කියල.''
''හ්ම්. එහෙම නූනා නම් මේ ගොඩක් දේවල් සෑහෙන වෙනස් වෙන්න තිබ්බ.'' මා එසේ පැවසුවේ මගේම සිතටය. අප දෙදෙනාට ඔබ්බෙන් පුටුවකට බරදී නිමල්කා කුමක් හෝ ගෙතුමක් කරමින් සිටියා මිස අපගේ කතාවට සම්බන්ද නො වූවාය.
55 වැනි විය එළඹීමත් සමගම මම ගුරු සේවයට සමුදුන්නෙමි. එකල පියුමිකා උසස් අධ්‍යාපනය අවසන් කරමින් සිටියාය. ඒ වන විටත් ඇය විශ්ව විද්‍යාලයේ කලා අංශයේ බොහොමයක් වැඩ කටයුතුවලට සම්බන්ධ වී සිටියාය.

''දුව. ඔයා කැමතිද තව ටිකක් වැඩිදුරට ඉගෙනගන්න. නැන්දලා ඔයාලගේ කෙටි චිත්‍රපටියක් බැලුවාලු ලන්ඩන්වලදී, මුණවීර මාම අහන්න කීවලු දුව එහෙ කැම්පස් එකක නාට්‍යය හා රංගනය ඉගෙනගන්න කැමතිද කියල.'' දිනක් රාත්‍රී කෑම මේසයේදීම පියුමිකාගෙන් විමසුවෙමි. එවිට ඇය පුදුමයෙන් අප දෙදෙනා දෙස බලා,

''මම .. ඉතින් කොච්චර හොඳද.'' කුඩා දැරියක මෙන් කෑගැසීය. නැවනත් ඇගේ මුහුණේ ඉරියව් වෙනස් විය.

"එනකොට ඔයාල..'' පියුමි අප දෙදෙනා දෙස බලමිණී ඇසුවාය.

නිහඬව ආහාර ගනිමින් උන් නිමල්කා, ''මගේ නම් අකමැත්තක්න් නෑ. තාත්තටත් යන්න ඕන තැනට යන්න බැරිලනා. ඉතින් සීයා කළා වගේ අපිත් කරන එක සාධාරණ නෑනේ, මම හිතන්නේ තාත්තට යන්න බැරි වුණ තැනට ඔයා යන එක හොඳයි කියල. ඒත් පරිස්සමින්. මේ තාත්තලගේ කාලේ නෙවේ.'' යි පැවසුවාය.

මද සිරිපොදක් පතිතවෙමින් තිබුණි. මම වසා සිටි දෙනෙත් යළිත් විවර කළෙමි. මවිසින් දිගහැර තිබූ අතීතය මදකට වසා තැබුවෙමි.
''අර මාධවී ගැන නිවුස්වලටත් කීවා''
නිමල්කා මා අදල වූ පුටුවකට බර වෙමින් කීවාය.
''හ්ම්. අපරාදේ ජීවිතේ නාස්ති කරගත්තා.''
''දැන් පත්තරකාරයෝ ඔයාවත් හොයනවා ඇති. ඔයන් යනවද මළගෙදර'' නිමල්කා සරදම් සිනාවකින් ඇසුවාය.
''ඔව් යනවා.'' මා අත තිබූ පුවත් පත පුටුව මතට විසි කරමින් නිවස තුළට ගියෙමි. මමත්, වසන්තත් මළගෙදර යාමට තීරණය කළෙමු. මදින් මද වැසි වැටුණු ඉරු දිනක උදෑසන අප එහි යාමට පිටත් වුනෙමු.
''අපරාදේ. ඉන්ඩස්ට්‍රියේ සෑහෙන කාලයක් ඉන්න හිටපු කෙනෙක්නෙ.. අකාලේ හැමදේම විනාශ කරගන්ත..''
ඇය මා වෙනුවෙන් බලා උන් බව මා දැනගත්තේ වසන්තගෙන් බොහෝ කලකට පසුවය. එහෙත් අප නොගැලපෙන දෙනෙකු බව, මා අමතක කර දමන ලෙසන් වසන්ත ඇයට පැවසූ බවද දැනගන්නට ලැබුණි. ඇය සතුව සහජයෙන් තිබූ හැකියාව වර්ධනය කරගන්නා ලෙස ඔහු ඇයට අවවාද කළ බවත්, ඉන් පසුව නිර්මාණය කළ ඔහුගේ විචාරක අවදානයට ලක් වූ චිත්‍රපටයක් සඳහා ප්‍රථම ඇරයුම සිදුකර තිබුණේද මාධවී ට බවත් ඔහු පසු කලෙක පුවත්පතකට ප්‍රකාශ කර තිබුණේය.

"කුරුණෑගල පැත්තේ පොල්වත්තක තිබුණු ලොකු ගෙදරක තමයි ඉදල තියෙන්නේ, වැඩට, තනිනොතනියට ඉදලතියෙන්නෙ. ගොළු කෙල්ලක් ලූ. කසාද බැඳපු මනුස්සයා මත්ද්‍රව්‍ය චෝදනාවකට ඩුබායි වලදි හිරේට වැටුනලු. හැබැයි දන්නා කියන කෙනෙක් කීවෙ ඒ මනුස්සය එක්ක තිබ්බ ආරවුලක් නිසා ඒවා ඒ බෑග් එකට දාන්න ඇත්තේ මාධවී කියලත් සැකයක් ඒ මනුස්සයාගේ පැත්තෙ අයට තියනවා කියල. කොහොමත් එච්චර හොඳ ජීවිතයක් ගෙවල නෑ. පස්සේ බැරීම තැන මෙහෙ ඇවින් ගෙදර නතර වෙලා ඉඳල තියනවා.''

වසන්ත ඈ පිළිබඳ තවත් බොහෝ විස්තර කීවේය. රථයේ ඉදිරිපස හිඳ කවුළුවෙන් එපිට ඇති අපැහැදිලි ඡායාවන් දෙස බලමින් එය අසා සිටියෙමි.

ඇගේ දෙමව්පියන්ගේ නිවසේ දේහය තබා තිබුණි. එහි ගිය මම වසර තිහකට පසුව නැවතත් ඇගේ මුහුණ දෙස එබී බැලුවෙමි. දැඩි චිත්ත පීඩාවෙන් සහ මැලවී ගිය මුහුණක් ඇති ගැහැනියක හැර මාධවී එහි නොවූවාය. නමුත් දේහය අසල තිබූ ඡායාරූපයේ එදා මා දුටු මාධවී මා දෙස බලා සිටියාය. තවත් ඈ අසල නොරැ දුණු මම ඇයට සමුදී පිටතට පැමිණියෙමි. ක්ෂේත්‍රයේ අප දන්නා හඳුනන කිසිවෙකුත් එහි පැමිණ සිටියේ ද නැත.

ඉන් වසර කිහිපයකට පසුව මම ඇයගේ දිවියේ මම දැන සිටි සහ අසා දැනගත් විවිධ දේ ඇසුරින් චිත්‍රපටයක් සඳහා තිර පිටපතක් නිර්මාණය කළෙමි. එය වසන්තගේ අතින් සිනමාවට නැගිණ. ඔහුගේ දැඩි ඉල්ලීම මත මෙහි ප්‍රධාන චරිතය නිරූපණය කළේ පියුමිකා විසිණි. ඒ සඳහා ඇයට වසරේ නැගීඑන නිළිය වෙනුවෙන් පිරිනැමෙන සම්මානය පවා හිමි විය. එහි තිරරචනය උදෙසා මට ද සම්මානයක් ලැබිණි. කලා ක්ෂේත්‍රය වෙනුවෙන් ලද බොහෝ දේ අතර මෙය සුවිශේෂී තිළිණයක ලෙස සඳහන් කරමින් මම එය දෝතට ගතිමි.
ගඟක් මෙන් ගලා ආ ජීවිතය තුළ හිමි වූ හිමි නොවූ බොහෝ දේ තිබිණ. අතීතය නම් තිරය මත දිගහරින ලද සිතුවම් පටයක් සේ දිස්විය. එකක් පසුපස එකක් ලෙස සිතට නැගුනු රූ මනසින් දකිමින් නිවසේ වැරැන්ඩාවේ හිඳගතිමි. මම ඈත අහස දෙස බලා උනිමි. දීප්තිමත්ව බැබළුණු තාරකා බොහොමයක් එහි විය. ඒ අතරින් ඇතැම් තරු හිටිවනම බිමට පනිනවනු පෙණුනි.